**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2020**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්දයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුමකරනය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 30 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ප්‍රදානයක් ලෙස ලැබී දැනට භාවිතයේ පවතින වාහන 06 හි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවන් තත්ත්වයන් සිදු නොවීමට අවශ්‍ය කටයුතු නිසි පරිදි කළමණාකරණය කර ගනිමි. | වාහන 06 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් නඩත්තු කිරීම වෙනුවෙන් දරන ලද රු.4,298,618 ක් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් වැඩියෙන් හා වර්ෂයේ ඌනතාවය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයන් වෙනුවෙන් ගිණුම් නිවැරදිව පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දී ඇත. | පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 02 ක ඉක්මවූ එකතුව රු.21,258,931 ක්වූ ලැබිය යුතු අයතම ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් ගිණුම් මඟින් ලියා හැරීමට අවස්ථා ගණනකදීම අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළද අනුමැතියක් නොලැබීම නිසා දිගින් දිගටම අක්‍රිය ශේෂයක් ලෙස පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතිය මත ලියා හැරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති එකතු වටිනාකම රු. 20,748,514 ක් වූ ගෙවිය යුතු වියදම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර ඒ තුළ වර්ෂ 03 කට වඩා වැඩි වූ ශේෂ 08 ක වටිනාකම රු.12,354,640 ක ශේෂ 8 ක්ද පැවතුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 04 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණවල ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්වීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ දීමනා හිමි නිලධාරීන් 32 දෙනෙකු වෙත එකතුව රු.8,629,870 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | එක් එක් පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් වන්නේ නම් පමණක් ඉදිරි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,063,873 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 51,749,516 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,685,643 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන සහ වෙනත් ආදායම් වැඩිවීමත් පඩිනඩි වියදම්, ගමන් වියදම්, සැපයුම් සේවා වියදම්, නඩත්තු වියදම්, ගිවිසුම් ගත සේවා, පුහුණු වියදම් සහ වෙනත් වියදම් වල අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 නොවැම්බර් 05 වන දින අවස්ථා 2 කදී i7 වර්ගයේ පරිගණක 84 ක් මිලදී ගැනීමේදී අවම මිල ඉදිරිපත් කළ ලංසු සුරක්ෂණයන්හි පැවති සුළු අඩුපාඩු අදාළ ආයතන වලින් නිවැරදි කර ගැනීමට විමසීමක් නොකර අවම මිල ප්‍රතික්ෂේප වීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.416,400 ක අලාභයක් සිදුවී තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව පරිගණක සැපයුම්කරුගෙන් කාර්යය සාධන සුරක්ෂණයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා දෙකකදී එකම වර්ගයේ පරිගණක මිල දී ගැනීම නිසා සිදු වී තිබූ මිල විචලනයෙන් රු.480,000 ක පාඩුවක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි. | පරිගණක 24 මිලදී ගැනීමට අදාළව ලංසු සුරක්ෂණය යොමු විය යුත්තේ උපකුලපති විය යුතු බවට ලංසු ලේඛන වල දක්වා තිබීම හේතුවෙන් හා පරිගණක 60 මිලදී ගැනීමට අදාළව පොත් පිංච ඉදිරිපත්ව නොතිබීම ප්‍රධාන බැහැරවීම් තත්ත්වයක් බව හඳුනා ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව අවම ලංසුව ප්‍රතික්ෂේප කර ඇත. කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගැනීම අඩුපාඩුවක් ලෙස සලකමි. 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇරඹීමට ප්‍රථම අවශ්‍යතා හඳුනා ගැනීමේ කමිටුවක් වෙත යොමු කර ඉන් ලැබෙන ප්‍රමුඛතාවය අනුව ප්‍රසම්පාදනයන් කිරීමට කටයුතු සම්පාදනය කරගෙන ඇති බව සඳහන් කරමි. | විශ්වවිද්‍යාලයට අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීම් සිදු කිරීමට අවධානය යොමුකළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය. වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මකට අනුව මිලදී ගැනීම් කළ යුතුය. |
| (ආ) වෘත්තීය අධ්‍යාපන අංශයේ 2018, 2019 හා 2020 වර්ෂයන් තුළදී තංගල්ල, යාපනය, මීගමුව, කළුතර, පානදුර, මට්ටක්කුලිය හා මඩකලපුව යන මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක වූ පාඨමාලා 13 ක පාඨමාලා හැර ගිය ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 20 ඉක්මවා ගොස් තිබුණි. මේ සඳහා පාඨමාලා සංවිධානය කිරීම, ගුණාත්මක බව, පාඨමාලා වල කාලීන බව, පාඨමාලා වැඩිදියුණු කිරීම්වල පවතින දුර්වලභාවය බව නිරීක්ෂණය විය. | පාඨමාලා හැර යාම සිසුන්ගේ අභිමතය පරිදි සිදුවන්නකි. පාඨමාලා වල ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් පවතී. පාඨමාලා පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් දැනට පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට අදහස් කර ඇත. | සිසුන් පාඨමාලා හැර යාම වලක්වා ගැනීම සඳහා කාලීන හා පාඨමාලාවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ප්‍රමාණවත් ඉඩකඩ තිබියදී ඒ කෙරෙහි අවධානය යොමු නොකර බදු පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක් සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.86,792,671 කට වඩා වැඩි මුදලක් දැරීමට සිදු වී තිබුණි. | 2015 සිට 2020 දක්වා වෘත්තීය පුහුණු සහ උසස් අධ්‍යයන අංශයේ පාඨමාලා සඳහා ශිෂ්‍ය වර්ධනය සිදුවී ඇති අතර මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අමාත්‍යංශයේ මුදල් ප්‍රතිපාදන ලබා නොදීමත් නිසා ,නිසි ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය කර බදු පදනම මත ගොඩනැගිල්ල ලබා ගැනීම සිදු කර ඇත. | රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු වර්ග 35 ක පුරප්පාඩු 141 ක් පැවතුණි. ඉන් උපදේශකවරුන් 47 දෙනෙකුගේ පුරප්පාඩු වර්ෂ ගණනාවක සිට පැවතුණි. පුරප්පාඩු පිරවීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් 25 දෙනෙකුගේ සේවය ලබා ගෙන සමාලෝචිත වර්ෂය තුලදී පමණක් රු.10,680,000 ක දීමනා ගෙවා තිබුණි. එසේම අනුමත කාර්ය මණ්ඩලය ඉක්ම වූ තනතුරු 04 ක නිලධාරීන් 11 දෙනෙකු රාජකාරී කටයුතු සඳහා යොදවාගෙන ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු. 3,909,180 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කොට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. සේවක අන්තර්ග්‍රහණයේදී අතිරික්ත සේවකයින් තනතුරට පෞද්ගලික වන සේ අන්තර්ග්‍රහණය කර ඇත. | අනුමත කාර්යමණ්ඩලයට අදාළ පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමේ කටයුතු සිදු කර ගත යුතුය. කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලද වහාම සේවක බඳවා ගැනීම් කඩිනම් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව 2018 සහ 2019 වර්ෂ වල වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | 2018 වාර්තා රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2019 වාර්තාව කෙටුම්පත් කර ඇත. | වාර්ෂික වාර්තා නියමිත කාලය තුළ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |